**වීරකැටිය ප්‍රාදේශීය සභාව - 2021**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1. තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

වීරකැටිය ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මුදල් තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වීරකැටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**--------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

**------------------------------------------------------------------------------------------**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන

නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1994 අංක 04 දරණ දකුණු පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය ප්‍රකාරව සභාවට නොලැබෙන 2012 වර්ෂයත් 2018 වර්ෂයත් අතර වූ ප්‍රමාද කාලය වසර 02 වඩා වැඩි රු. 13,421,378 ක මුද්දර ගාස්තු ලැබිය යුතු ශේෂයක් ලෙස වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | හිඟ මුද්දර ගාස්තු පිළිබඳව 2021 වර්ෂයේ සිට ප්‍රධාන ලේකම් වෙත ලිපි මඟින් ඉල්ලීම් කළ බවත්, ඒ සඳහා ලබාදෙන ප්‍රතිචාර මත ඉදිරියේදී කටයුතු කරමි. | ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ගිවිසුම්ගත වූ කර්මාන්ත වෙනුවෙන් දෙසැම්බර් 31 දිනට වෙන්කළ ණයහිමි ප්‍රතිපාදනය රු. 1,679,065 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන සකස් කරන අවස්ථාව වන විට බිල්පත් සකස් කර නොතිබූ බැවින් ගිවිසුම්ගත වටිනාකම ගිණුම්ගත කිරීම නිසා වෙනසක් පවතින බව . | ණයහිමි ප්‍රතිපාදන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී රු. 1,074,305 ක් වූ ප්‍රාග්ධන වත්කම් මිලදීගැනීමෙ වියදම් පුනරාවර්ථන වියදම් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් ප්‍රාග්ධන වියදම් අඩුවෙන් දැක්වුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |
| (ඈ) | 2020 වර්ෂයට අදාළ එකතු වටිනාකම රු. 215,725 ක් වූ වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | වියදම් නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන / උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු. 556,071 ක වෙනසක් විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 21,423,227 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,240,704 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් ඒකක 2354 කින් ලැබිය යුතු රු. 5,456,072 ක වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර හිගයෙන් රු. 219,623 ක් රාජ්‍ය ආයතන වලින් ලැබිය යුතු ශේෂයක් විය. | 2022 වර්ෂයේ සිට හිඟ වරිපනම් බදු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ආ) | **කුලී** | | |
| i. | සමාලෝචිත වර්ෂය සඳහා කඩ කාමර 60 කින් ලැබිය යුතු කඩ කාමර කුලී රු. 433,018 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු. 57,300 ක් කපාහැරීම සඳහා අනුමැතියට ආන්ඩුකාරවරයාට යොමුකළ බවත්, ඉතිරි හිඟ අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| ii. | සමාලෝචිත වර්ෂය සඳහා මහජන පොළ 03 ක් බදු දීම වෙනුවෙන් ලැබිය යුතු රු. 14,727,055 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු. 4,812,240 ක් සඳහා නිතිමය ක්‍රියාමාර්ග ගන්නා බවත්, රු. 10,075,343 ක මුදලක් සභා තීරණ මත කපා හරින ලද බවත්, ඉතිරිය අයකර ගනිමි. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කරුණු විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1982 අංක 04 දරණ නාගරික සංවර්ධන අධිකාරී (සංශෝධිත) පනතේ 8 ඒ (1) හා (2) වගන්ති, 28 (ආ) 3 (අ) වගන්ති, 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 49 හා 50 වගන්ති ප්‍රකාරව අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් කටයුතු කළයුතු වුවත් 2011 වර්ෂයත් 2021 වර්ෂයත් අතර ඉදිකළ අනවසර ඉදිකිරීම් 47 ක් සම්බන්ධයෙන් විගණන දිනය වූ 2022 පෙබරවාරි 10 දින වන විටත් එම ඉදිකිරීම් නිවැරදි කිරීමට ගතයුතු ක්‍රියාමාර්ග සභාවේ කළමනාකාරීත්වය විසින් ගෙන නොතිබුණි. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනිම පිළිබද දැනුම නිළධාරීන්ට නොමැති වුයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනිම නොහැකි වු බවත්, ඒ සදහා නාගරික සංවර්ධන අධිකාරියේ උපදෙස් සහ සහයෝගය ලබාගැනීමට කටයුතු කරමි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |